# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : PE/24/<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2015.07.30<br>திகதி |

චක්‍රලේඛ අංක -TR/2015/12

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17</u>**
**<u>මැතිවරණ රාජකාරී සඳහා යොදවනු ලබන නිලධාරීන්ට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීම.</u>**

**2015.08.17** දින පැවැත්වීමට නියමිත ඉහත සඳහන් පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද රාජකාරී සඳහා තෝරා ගෙන ඇති ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පත්කර ඇති දිස්ත්‍රික්කයට යාමට රාජකාරී දුම්රිය බලපත් ඉල්ලා සිටින්නේ නම් එම ඉල්ලීම් පරිදි ඔවුනට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීමට කරුණාකර පියවර ගන්න. එම බලපත් නිකුත් කිරීම්, ආයතන සංග්‍රහයේ සඳහන් දුම්රිය බලපත් නිකුත් කිරීම හා සම්බන්ධ විධිවිධාන පරිදි සිදුකළ යුතුවේ.

**02.** බලපත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

**02.1** දෙපාර්තමේන්තු සංකේත අංකය ලෙස **5422/1** රබර් මුද්‍රාවකින් සටහන් කිරීම වෙනුවට පැහැදිලි ලෙස අතින් ලියන්න.

**02.2** රාජකාරියේ ස්වභාවය "**2015.08.17** දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ රාජකාරී" යනුවෙන් ද සටහන් කරන්න.

**02.3** වැය ශීර්ෂය :**20-1-1-1405**

**03.** බලපත් නිකුත් කරන ලද නිලධාරියාගේ තනතුර සටහන් කිරීමට ඇති ස්ථානයේ බලපත්‍රය අත්සන් කරන ලද නිලධාරියාගේ නිල මුද්‍රාව තබා ඊට යටින් "මැතිවරණ කොමසාරිස් වෙනුවට" යනුවෙන් අකුරින් ලියන්න.

**04.** මේ යටතේ නිකුත් කරන සියළුම බලපත්‍ර බේරුම් කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එහෙයින් මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන දුම්රිය බලපත් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන දෙපාර්තමේන්තු විසින් මුදල් ගෙවීමක් සිදු කළයුතු නොවේ.

05. මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන සියළුම දුම්රිය බලපත් පිළිබඳ විස්තරයක් මේ සමග අමුණා ඇති ආදර්ශ ලිපිය පරිදි සකස් කර මැතිවරණය නිමවී සති දෙකක් තුළදී මා වෙත ලැබෙන සේ එවීමට කරුණාකර කටයුතු කරන්න.

06. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වෙත යැවීමට ද කරුණාකර කටයුතු කරන්න.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්

පිටපත් :-

1. විගණකාධිපති
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා
4. දුම්රිය ගණකාධිකාරී (ආදායම් II)
5. ප්‍රධාන ගණකාධිකාරී
6. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
7. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා
8. ගණකාධිකාරී (ගෙවීම්)


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*

මගේ අංකය :
දිනය :

මැතිවරණ කොමසාරිස්,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17</u>

<u>මැතිවරණ රාජකාරී සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලයට නිකුත් කළ රාජකාරී දුම්රිය බලපත්</u>

2015.08.17 දින පැවැති නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පත්කරනු ලැබූ නිලධාරීන්ට මෙම අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජකාරී දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

02. මෙම බලපත්‍ර සඳහා අදාළ බිල්පත ඔබගේ වැය ශීර්ෂයන්ගෙන් නිරවුල් කිරීම සඳහා මෙම විස්තර ඔබ වෙත ඉදිරිපත් කරමි.

.............................................

ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා

..........................................අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව

| (1) බලපත්‍රය නිකුත් කළ දිනය | (2) නිලධාරියාගේ නම | (3) බලපත්‍ර අංකය | (4) දුම්රිය ස්ථාන | |
|---|---|---|---|---|
| | | | ගමන ආරම්භ කළ දුම්රිය ස්ථානය | ගමන අවසන් කළ දුම්රිය ස්ථානය |
| | | | | |